# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்

# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
kfsph;> rpWth; mYty;fs; kw;Wk; r%f ghJfhg;G mikr;R - r%fghJfhg;G gphpT
**Ministry of Women, Child Affairs and Social Security – Social Security Division**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No   DSD/HO/13/HR/001/Plan/2020 | ඔබේ අංකය<br>உமது இல<br>Your No   ........................ | දිනය<br>திகதி<br>Date   2020.01.14 |

සියළුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්,

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

**<u>2020 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සැකසීම සඳහා තොරතුරු ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාළව කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්ගේ අංක.MWCA&SS/HRDSD/01/05/01 දරණ 2020.01.08 දිනැති ලිපිය හා බැඳේ. (අදාළ ලිපියේ පිටපතක් මේ සමග අමුණා ඇත)

02. එහි සඳහන් පරිදි රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක.02/2018 හා 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 වර්ෂයට අදාළ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කළ යුතුය. මෙම සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම පිණිස මේ සමග අමුණා ඇති ආකෘති පත්‍රයට අනුව ඔබගේ දිස්ත්‍රික්කයට / අංශයට අනුයුක්තව සේවය කරන සියළුම නිලධාරීන්ගේ (ඉහළ තලයේ විධායක නිලධාරීන්ගේ සිට ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන් දක්වා ) තොරතුරු අනිවාර්යෙන් ලබා ගන්නා මෙන් දන්වා සිටිමි.

03. මෙසේ එක් එක් නිලධාරීන්ගෙන් වෙන් වෙන්ව ලබා ගන්නා තොරතුරු 2020.01.20 දිනට ප්‍රථමව මානව සම්පත් සංවර්ධන අංශයට හෝ training@samurdhi.gov.lk යන විද්‍යුත් ලිපිනයට ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

**නිමල් කොටවලගෙදර**

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත :- සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන) - මෙම තොරතුරු දෙපාර්තමේන්තුවේ වෙබ්අඩවියට ඇතුළත් කිරීම සඳහා

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන)<br>பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்)<br>Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு
சமூக பாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security
Social Security Division


මගේ අංකය : / எனது இல : / My No. : MWCA&SS/HRDSD/01/05/01

ඔබේ අංකය : / உமது இல : / Your No. :

දිනය : / திகதி : / Date : 2020.01.08

**අධ්‍යක්ෂ ජනරාල්**
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
04 වන මහළ, සෙත්සිරිපාය - I අදියර
බත්තරමුල්ල

**අමාත්‍යාංශය සඳහා "මානව සම්පත් සංවර්ධන සැලැස්ම - 2020" සැකසීම සඳහා තොරතුරු ලබා ගැනීම**

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 02/2018 හා 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා බැඳේ.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය තුළ කේන්ද්‍ර වී පවත්නා මානව සම්පත කාර්යක්ෂමව, ගුණාත්මකව හා සඵලදායි ලෙස රටේ සංවර්ධනය සඳහා ප්‍රාග්ධනයක් ලෙස යොදා ගැනීම පිණිස රාජ්‍ය අංශය සතු මානව සම්පත සැලසුම් සහගතව සංවර්ධනය කිරීම අනිවාර්යෙන්ම සිදු විය යුතු අවශ්‍යතාවයක් බවත්, ඒ සඳහා රාජ්‍ය ආයතනවල සේවය කරනු ලබන සමස්ත කාර්ය මණ්ඩලයේ එක් එක් නිලධාරීන් හට පැවරී ඇති විෂයන්වලට අදාළව දැනට පවතින නිපුණතාවය හා රාජකාරී වඩාත් සාර්ථක ලෙස ඉටු කිරීම පිණිස තවදුරටත් පැවතිය යුතු නිපුණතාවය අතර පවතින පරතරය හඳුනා ගැනීමටත්, එම පරතරය පියවීම පිණිස කවර ආකාරයේ මානව සම්පත් සංවර්ධනයක් සිදුවිය යුතු දැයි හඳුනා ගැනීම පිණිසත්, ඒ අනුව අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සියළුම රාජ්‍ය ආයතන විසින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් අනිවර්යයෙන්ම සකස් කළ යුතු බව ඉහත චක්‍රලේඛය මගින් අවධාරණය කර ඇති අතර රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරීන් වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවන් සඳහා සහභාගි කරවිය යුතු බව ද වැඩිදුරටත් අදාළ චක්‍රලේඛය මගින් අවධාරණය කර තිබේ.

එසේම අවම වශයෙන් වසර දෙකකට වරක්වත් සකසන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කළ යුතු බවත්, 2018 වර්ෂයේ සිට මෙය ක්‍රියාත්මක කළ යුතු බවත් ඉහත චක්‍රලේඛය මගින් නියම කර ඇති නමුත් මෙතෙක් මෙම අමාත්‍යාංශය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකසා නොතිබීම, 2018 මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් මාර්ගගත ක්‍රමයට රාජ්‍ය ආයතන ඇගයීමේ දී අමාත්‍යාංශය සඳහා ලබා දුන් ලකුණු අඩුවීමට හේතුවක් වී ඇති බව 2019.11.25 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී හෙළි විය.


| | | |
|---|---|---|
| අමාත්‍ය/ அமைச்சர்/ Minister | දුරකථන/தொ.பே./Tel. : 011- 2186 241 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2187 323 |
| රාජ්‍ය අමාත්‍ය/இராஜாங்க அமைச்சர்/State Minister | දුරකථන/தொ.பே./Tel. : 011 - 2861 145 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2884 613 |
| ලේකම්/செயலாளர்/Secretary | දුරකථන/தொ.பே./Tel. : 011 - 2186 057 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2187 249 |
| රාජ්‍ය ලේකම්/இராஜாங்க செயலாளர்/State Secretary | දුරකථන/தொ.பே./Tel. : 011 - 2883 525 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2187 007 |
| අමාත්‍යාංශ කාර්යාලය/அலுவலகம்/General Office | දුරකථන/தொ.பே./Tel. : 011 - 2887 349-51 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2877 127 |

අමාත්‍යාංශය / அமைச்சு | 1වන මහල, සෙත්සිරිපාය අදියර II, බත්තරමුල්ල. / 1ஆவது மாடி, செத்சிறிபாயகட்டம் II, பத்தரமுல்லை.
www.socialemwelfare.gov.lk

විද්‍යුත්තැපැල/மின்னஞ்சல்/E-mail : secycdwa@gmail.com
වෙබ් අඩවිය/இணையத்தளம்/Website : www.socialemwelfare.gov.lk

එබැවින් අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මෙම අමාත්‍යාංශය සඳහා 2020 වර්ෂයට මානව සම්පත් සංවර්ධන සැලැස්මක් නොපමාව සැකසිය යුතුව ඇත. **අදාළ සැලස්ම සැකසීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම පිණිස මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රයට අනුව සකසනු ලබන වාර්තාව ඔබ දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන සියළුම නිලධාරීන් සඳහා වෙන වෙනම සම්පූර්ණ කර 2020.01.20 දිනට ප්‍රථම අතිරේක ලේකම් (මානව සම්පත් සංවර්ධන), 9 වන මහල, සෙත්සිරිපාය - II අදියර, බත්තරමුල්ල යන ලිපිනය වෙත ද, එහි මෘදු පිටපත <u>pwprogramme@gmail.com</u> යන ඊ-මේල් ලිපිනය වෙත ද නොපමාව යොමු කිරීමට අවශ්‍ය කටයුතු සලසන මෙන් කාරුණිකව දැනුම් දෙමි.**

සකසනු ලබන මානව සම්පත් සංවර්ධන සැලැස්ම සඳහා අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන ලබන ඉහළම තලයේ විධායක නිලධාරියාගේ සිට ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරියා දක්වා වු සියළුම නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් කළ යුතු බැවින් ඉහත සඳහන් ආකෘති පත්‍රය අනුව සකසනු ලබන වාර්තාව ඔබ දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන ඉහළම තලයේ විධායක නිලධාරියාගේ සිට ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරියා දක්වා වු සියළුම නිලධාරීන් විසින් අනිවාර්යයෙන්ම සම්පූර්ණ කළ යුතු බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

කාර්ය මණ්ඩල පුහුණුව සඳහා රජයේ වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කරනු ලබන ආයතන විසින් තම ආයතනයට අදාළව 2020 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සැකසිය යුතු අතර එහි පිටපතක් අතිරේක ලේකම් (මානව සම්පත් සංවර්ධන) වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

මෙය ප්‍රමුඛ අවශ්‍යතාවයක් ලෙස සලකා අදාළ තොරතුරු නොපමාව ලබා දීම සඳහා ඔබ විසින් සිදු කරනු ලබන මැදිහත් වීම බෙහෙවින් අගය කරමි.

**එච්. ඒ. හේමා පෙරේරා**
අතිරේක ලේකම් (මානව සම්පත් සංවර්ධන)

අ/කළේ **අශෝකා අලවත්ත**
ලේකම්
සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය